## මාසික වැටුප් පරිමාණය හා වයස

| අංකය | තනතුරු නාමය | වැටුප් කාණ්ඩය | වැටුප් පරිමාණය කළමණාකරණ සේවා චක්‍රලේඛ (01/2025) අනුව | වයස |
|---|---|---|---|---|
| 1 | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) | HM 1-3 | 152,500/- 15 X 4,100/- 214,000/- | අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර 55ට නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.) |
| 2 | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සැලසුම් පර්යේෂණ හා සංවර්ධන) | HM 1-3 | | |
| 3 | සහකාර සාමාන්‍යාධිකාරී (ඉංජිනේරු සේවා හා ඉදිකිරීම්) | HM 1-1 | 140,640/- 15 X 4,100/- 202,140/- | අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර 55ට නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.) |
| 4 | සහකාර සාමාන්‍යාධිකාරී (තොරතුරු තාක්ෂණ) | HM 1-1 | | |
| 5 | කළමනාකරු (මානව සම්පත් කළමනාකරණ) | MM 1-1 | 91,690/- 10 X 2,480/- 15 X 3,450/- 168,240/- | අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර 45ට නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.) |
| 6 | කළමනාකරු (පරිපාලන) | MM 1-1 | | |
| 7 | කළමනාකරු (විමර්ශන) | MM 1-1 | | |
| 8 | කළමනාකරු (සැපයුම්) | MM 1-1 | | |
| 9 | ගිණුම් නිලධාරී | JM 1-1 | 72,650/- 10 X 1,360/- 18 X 2,040/- 122,970/- | අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර 45 ට නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.) |
| 10 | තාක්ෂණ සහකාර | MA 2-2 | 50,540/- 10X540/- 7X630/- 4X1,080/- 20X1,280/- 90,270/- | අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර 45ට නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.) |
| 11 | තාක්ෂණ සහකාර (විදුලි) | MA 2-2 | | |
| 12 | මුදල් අයකැමි | MA 1-2 | 46,220/- 10X540/- 7 X 630/- 12X 1,080/- 12X 1.280/- 84,350/- | අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර 45ට නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.) |
| 13 | විදුලි කාර්මික | PL 3 | 43,280/- 10 X 490/- 10X540/- 10X590/- 12X630/- 67,040/- | |
| 14 | ලේඛනාගාර භාරකරු | PL 1 | 40,500/- 10X450/- 10X490/-7X540/- 15X590/- 62,530/- | අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර 45ට නොවැඩි විය යුතුය. |

(වගු අංක - 02)

## පුරප්පාඩු සේවා ස්ථාන

| අංකය | තනතුරු නාමය | වැටුප් කාණ්ඩය | සේවා ස්ථාන |
|---|---|---|---|
| 1 | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) | HM 1-3 | ප්‍රධාන කාර්යාලය |
| 2 | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සැලසුම් පර්යේෂණ හා සංවර්ධන) | HM 1-3 | |
| 3 | සහකාර සාමාන්‍යාධිකාරී (ඉංජිනේරු සේවා හා ඉදිකිරීම්) | HM 1-1 | |
| 4 | සහකාර සාමාන්‍යාධිකාරී (තොරතුරු තාක්ෂණ) | HM 1-1 | |
| 5 | කළමනාකරු (මානව සම්පත් කළමනාකරණ) | MM 1-1 | |
| 6 | කළමනාකරු (පරිපාලන) | MM 1-1 | ප්‍රධාන කාර්යාලය 04, අම්පාර - 01, කළුතර 01, කෑගල්ල -01, කිළිනොච්චි - 01, කුරුණෑගල 01, කොළඹ -01, ත්‍රිකුණාමලය - 01, නුවර එළිය 01, පුත්තලම -01,පොළොන්නරුව -01, බදුල්ල 01, මඩකළපුව -01, මත්තාරම -01, මහනුවර 01,මොනරාගල -01, යාපනය -01, රත්නපුර 01,වව්නියාව -01, හම්බන්තොට -01 යන දිස්ත්‍රික් කාර්යාල සඳහා සහ කොළඹ නගර උතුර කාර්යාලය - 01, කොළඹ නගර දකුණ කාර්යාලය - 01 |
| 7 | කළමනාකරු (විමර්ශන) | MM 1-1 | ප්‍රධාන කාර්යාලය |
| 8 | කළමනාකරු (සැපයුම්) | MM 1-1 | |
| 9 | ගිණුම් නිලධාරී | JM 1-1 | ප්‍රධාන කාර්යාලය - 03, අනුරධපුර - 01, අම්පාර 01, කළුතර -01, කෑගල්ල - 01, කිළිනොච්චි -01, කුරුණෑගල 01, ගම්පහ 01, ගාල්ල -01, ත්‍රිකුණාමලය - 01,පොළොන්නරුව - 01, බදුල්ල 01, මඩකළපුව - 01, මත්තාරම-01,මාතලේ 01,මුලතිව් - 01, මොනරාගල - 01, යාපනය -01, වව්නියාව -01, හම්බන්තොට - 01 යන දිස්ත්‍රික් කාර්යාල සඳහා |
| 10 | තාක්ෂණ සහකාර | MA 2-2 | කළුතර 01, කෑගල්ල- 01 කුරුණෑගල - 06, ගම්පහ 04, මහනුවර - 03,- ගාල්ල -01, රත්නපුර - 03, යන දිස්ත්‍රික් කාර්යාල සඳහා සහ කොළඹ නගර උතුර කාර්යාලය -01 කොළඹ නගර දකුණ කාර්යාලය - 01 බැගින් වන සේ. |
| 11 | තාක්ෂණ සහකාර (විදුලි) | MA 2-2 | ප්‍රධාන කාර්යාලය |
| 12 | මුදල් අයකැමි | MA 1-2 | ප්‍රධාන කාර්යාලය - මුදල් කොට්ඨාසය-03, අනුරාධපුර - 01, අම්පාර- 01, කළුතර - 01, කෑගල්ල - 01, කිළිනොච්චි - 01, කුරුණෑගල - 01, කොළඹ - 01, ගම්පහ - 01, ගාල්ල - 01, ත්‍රිකුණාමලය - 01, නුවරඑළිය - 01, පුත්තලම - 01, පොළොන්නරුව - 01, බදුල්ල - 01, මඩකළපුව -01, මත්තාරම - 01, මහනුවර - 01, මාතර - 01, මාතලේ - 01, මුලතිව් - 01, මොනරාගල - 01, යාපනය - 01, රත්නපුර - 01, වව්නියාව -01, හම්බන්තොට - 01 දිස්ත්‍රික් කාර්යාල සඳහා සහ කොළඹ නගර උතුර කාර්යාලය - 01 කොළඹ නගර දකුණ කාර්යාලය - 01 |
| 13 | විදුලි කාර්මික | PL 3 | ප්‍රධාන කාර්යාලය |
| 14 | ලේඛනාගාර භාරකරු | PL 1 | ප්‍රධාන කාර්යාලය - 01, අනුරධපුර - 01,අම්පාර - 01, කළුතර - 01, කෑගල්ල - 01, කුරුණෑගල 01,කොළඹ 01,ගම්පහ 01, ගාල්ල -01, ත්‍රිකුණාමලය 01,පුත්තලම 01, පොළොන්නරුව - 01, බදුල්ල - 01, මඩකළපුව - 01, මහනුවර - 01, මාතර - 01, මොනරාගල 01, යාපනය -01, රත්නපුර - 01, වව්නියාව -01 යන දිස්ත්‍රික් කාර්යාල සඳහා |

(වගු අංක - 03)

## බඳවා ගැනීමේ ක්‍රමය ;

විවෘත තරග විභාගයක් හා / හෝ පත්වීම් බලධරයා විසින් පත් කරන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගනු ලැබේ.

**පොදු කොන්දේසි**

- අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
- තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
- විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

**ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ලබා දෙනු ලබන අනෙකුත් ප්‍රතිලාභ**

- වෛද්‍ය ප්‍රතිලාභ
- නිවාඩු දින දීමනා
- දිරි දීමනා හා ප්‍රසාද දීමනා
- වෘත්තීය දීමනා (HM සහ MM වැටුප් කාණ්ඩවල තනතුරු සඳහා) හා අනුමත අනෙකුත් දීමනා
- රාජකාරී ගමන් වියදම් හා සංයුක්ත දීමනා
- සහනදායී පොලී ප්‍රතිශතයන් යටතේ සේවක ණය පහසුකම් (මාණ්ඩලික නිවාස ණය, ආපද ණය පහසුකම්), චක්‍රලේඛ ප්‍රකාරව වෙනත් සුභ සාධක පහසුකම්

HM සේවා ගණයේ තනතුරකට බඳවා ගැනීමේදී කළමනාකරණ මට්ටමේ සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ සේවා පළපුරුද්ද අපේක්ෂා කරනු ලබන අතර, එවැනි මට්ටමේ පළපුරුද්දක් සළකා බැලිය හැකි වන්නේ ප්‍රථම උපාධිය සම්පූර්ණ කිරීමෙන් අනතුරුව වේ.

MM වැටුප් කාණ්ඩයේ තනතුරක් සඳහා බඳවා ගැනීමේදී උපාධිය මූලික සුදුසුකමක් වන, මධ්‍ය කළමනාකරණ මට්ටමේ (MM) තනතුරකට ආසන්න පහළ තනතුරකට එනම් කනිෂ්ඨ කළමනාකරණ මට්ටමේ (JM) වසරක පළපුරුද්දක් පැවතිය යුතු අතර, ඒ සඳහා කළමනාකරණ සහකාර තනතුරක පළපුරුද්ද අදාළ කර ගත නොහැකිය.

ඉහත සඳහන් වයස් සීමාවන් රජයේ / රාජ්‍ය සංස්ථාවක / මණ්ඩලයක / ව්‍යවස්ථාපිත ආයතනයක සේවයේ නියුතු සේවකයින්ට බල නොපැවැත්වේ.

දැනට රජයේ /රාජ්‍ය සංස්ථා / මණ්ඩල / ව්‍යවස්ථාපිත ආයතනවල සේවය කරන අයදුම්කරුවන් ආයතන ප්‍රධානී මගින් තම අයදුම්පත් යොමු කිරීමට කටයුතු කළ යුතුය.

එසේම ඔබ විසින් ඉහත සඳහන් පුරප්පාඩු තනතුරු සඳහා ඔබගේ අයදුම්පත යොමු කිරීමේදී පහත සඳහන් තොරතුරු ඉදිරිපත් කළ යුතුය.

අ - ජීව දත්ත අයදුම්පත

ආ - සුදුසුකම් හා පළපුරුද්ද සනාථ කරන සහතික වල සහතික කරන ලද ඡායා පිටපත්

ඇ- ඔබ සම්බන්ධ කරගත හැකි දුරකථන අංක

ඈ - ජාතික හැඳුනුම්පත / විදේශ ගමන් බලපත්‍රය/ රියදුරු බලපත්‍රයේ සහතික කරන ලද ඡායා පිටපතක්

ඔබ අයදුම් කරන තනතුර සඳහා අයදුම්පත් භාරගන්නා අවසන් දිනට සෑම ආකාරයකින්ම සුදුසුකම් සපුරා තිබිය යුතුය.

පත් වීම් බලධාරියා විසින් නියම කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලබන අතර, ඉහළම ලකුණු ලැබූවන් අතරින් කුසලතා අනුපිළිවෙල අනුව තෝරා ගැනීම සිදු කෙරේ.

සුදුස්සන් තෝරා ගැනීම සම්බන්ධයෙන් අවසන් තීරණය ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතුවේ.

සියලුම ජීව දත්ත තොරතුරු ඇතුලත් අයදුම්පතක් සකස් කර අදාළ සහතික වල සහතික කරන ලද ඡායා පිටපත්ද සමග ඥාති නොවන දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් හා දුරකථන අංකයන්ද සහිතව මෙම දැන්වීම පළවී දින 14 ක් ඇතුළත පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

**සැ.යු.:** අසම්පූර්ණව යොමු කරනු ලබන අයදුම්පත් කිසිදු හේතුවක් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම් කරන තනතුර ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ පැහැදිලිව සටහන් කරන්න.

**සභාපති,**
**ජාතික නිවාස සංර්වධන අධිකාරිය,**
**ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,**
**කොළඹ 02.**

**දුරකථන අංක - 011 2446180 /011 2473913**